# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No | 10120 | ෆැක්ස් / தொலைநகல / Fax | 011-2171635 |
| දුරකථන / தொலைபேசி / Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site | www.Police.lk |
| ඊ මේල් / மின்னஞ்சல் / E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My NO | 1578 /2024 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No | / 2024 | දිනය / திக / Date | 14/10 /2024 පැය 0550 |

**මාධ්‍ය නිවේදනය**

**01. මනුෂ්‍ය ඝාතනයක් - ගල්කිස්ස පොලිස් වසම.**

2024.10.13 වන දින දහවල් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේ පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී කළුබෝවිල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට ගල්කිස්ස පොලිස් ස්ථානයට ලදපණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ බඩෝවිට, ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු සමග තවත් පුද්ගලයින් දෙදෙනෙකු අතර ඇති වූ පුද්ගලික ආරවුලක් හේතුවෙන් මරණකරුට එම පුද්ගලයින් දෙදෙනා විසින් තියුණු ආයුධයකින් පහර දී මෙම ඝාතනය සිදුකර ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සිද්ධියට අදාල සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. ද්විත්ව මනුෂ්‍ය ඝාතනයකට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - අහංගම පොලිස් ස්ථානය.**

2024.10.04 වන දින උදෑසන කාලයේ අහංගම පොලිස් වසමේ වැල්හේන්ගොඩ ප්‍රදේශයේ නිවසක් තුල මහළු යුවලක් ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධයෙන් අහංගම පොලිසිය හා ගාල්ල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මඟින් වැඩිදුර විමර්ශනයක් ආරම්භ කර තිබුණි. ඒ අනුව මෙම අපරාධයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු 2024.10.13 වන දින උදෑසන කාලයේ ගාල්ල ගංගාරාම මාවත ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන මාගාල්ල, ගාල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අහංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.10.13 වන දින ගල්කිස්ස පොලිස් වසමේ කන්දේමුල්ල හා රත්මලාන ප්‍රදේශවලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 03 ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 400 ක්, හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 750 ක් හා හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 200 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු හා සැකකාරියක් අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 30 හා 50 වයස් වල පසුවන කළුතර දකුණ හා රත්මලාන ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර සැකකාරිය වයස අවුරුදු 43 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පමුණුගම පොලිස් ස්ථානය.

2024.10.13 වන දින සවස් කාලයේදී පමුණුගම පොලිස් වසමේ මුතුරාජවෙල වගුරුබිම් ප්‍රදේශයේදී පමුණුගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 2268 (බැරල් 12) සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 69 ක් වන පුබුදුගම, උස්වැටකෙයියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාමක් - උහන පොලිස් වසම.

2024.10.13 වන දින දහවල් කාලයේ උහන පොලිස් වසමේ වැවේගම ප්‍රදේශයේ පුද්ගලයෙකුට විදුලි සැර වැදීමකින් මියගොස් ඇති බවට උහන පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 73 ක් වූ වැවේගම, බොක්කබැද්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු විසින් අනවසර විදුලි රැහැනක් සකස් කරමින් සිටියදී, විදුලි සැර වැදී මියගොස් ඇති බවට විමර්ශන වලදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අම්පාර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර උහන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. නීති විරෝධී ලෙස මෙරටට සිගරට් රැගෙන එන ලද සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකය.

2024.10.13 වන දින සවස් කාලයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය කටුනායක ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **තීරුබදු රහිතව** ඩුබායි රාජ්‍යයේ සිට **මෙරටට** රැගෙන **එන ලද සිගරට් 25000 (කාටුන් 125) ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 40 ක් වන බිංගිරිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකය මගින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - ගම්පොල පොලිස් වසම.

2024.10.13 වන දින දහවල් කාලයේ ගම්පොල පොලිස් වසමේ ගම්පොල නාවලපිටිය මාර්ගයේ ගම්පොල නගරයේදී ගම්පොල දෙස සිට නාවලපිටිය දෙසට ධාවනය වූ ජීප් රථයක් ඉදිරියෙන් ධාවනය වූ ත්‍රීරෝද රථයක ගැටී පෙරලී රියදුරු හා කුඩා දරුවෙකු ඉන් විසි වී ගොස් ත්‍රීරෝද රථය නතර වී ඇති අතර ජීප් රථයද ඉදිරියටම ධාවනය වී වෙළඳාම් කරන කරත්තයක හා තවත් ත්‍රීරෝද රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ රියදුරු, පිරිමි දරුවා හා වෙළඳාම් කටයුතු වල යෙදී සිටි පුද්ගලයෙකු ගම්පොල රෝහලට ඇතුලත් කිරීමේදී පිරිමි දරුවා මියගොස් ඇත.

**මිය ගිය දරුවා වයස අවුරුදු 03 ½ ක් වූ ඉල්ලවතුර, ගම්පොල ප්‍රදේශයේ පදිංචි දරුවෙකි.**

මෘත ශරීරය ගම්පොල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට අදාල ජීප් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. ගම්පොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - කළුවාංචිකුඩි පොලිස් වසම.

2024.10.13 වන දින උදෑසන කාලයේ කළුවාංචිකුඩි පොලිස් වසමේ මඩකලපුව කල්මුණ ප්‍රධාන මාර්ගයේ ඔන්දච්චිමඩම් ප්‍රදේශයේදී මඩකලපුව දෙස සිට කල්මුණ දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ පෙරලී පැදිකරු හා පසුපැදිකරු නවතා තිබූ ත්‍රීරෝද රථයක ගැටී ඇති අතර යතුරුපැදිය ඉදිරියට ඇදීගෙන ගොස් පාපැදිකරුවෙකුගේද ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පැදිකරු, පසුපැදිකරු හා පාපැදිකරු කලවංචිකුඩි රෝහලට ඇතුලත් කිරීමේදී පසුපැදිකරු මියගොස් ඇත. පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා මඩකලපුව රෝහල වෙත මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 17 ක් වූ තාන්දාමලය, කොක්කඩිචෝලය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කළුවාංචිකුඩි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කළුවාංචිකුඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**